# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1140/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 11/07/2024 පැය 2220

## මාධ්‍ය නිවේදනය

### මත්ද්‍රව්‍ය විනාශ කිරීම - පොලිස් මූලස්ථානය.

ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බලකාය හා නාවික හමුදාව විසින් සිදුකල වැටලීම් මගින් අත්අඩංගුවට ගන්නා ලද කොකේන් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 355 ග්‍රෑම් 881 ක් පොලිසිය මූලිකත්වයෙන් පුත්තලම වනාතවිල්ලුව ප්‍රදේශයේ ඉදිකළ දහන උදුන භාවිතයෙන් 2024.07.11 වන අද දින අලුත්කඩේ ගරු ප්‍රධාන මහේස්ත්‍රාත් තිලිණ ගමගේ මහතා ඉදිරියේදී විනාශ කරන ලදී.

2024.05.18 වන දින ආරම්භ කරන ලද මෙම උදුනෙහි තෙවන වරට විනාශ කරන ලද මත්ද්‍රව්‍ය ප්‍රමාණයත් සමඟ උදුන භාවිතයෙන් විනාශ කල මුළු මත්ද්‍රව්‍ය ප්‍රමාණය කිලෝග්‍රෑම් 1889 ග්‍රෑම් 882 කි. එහි දළ වටිනාකම රුපියල් මිලියන 19,167 කට ආසන්න වන අතර, එය පහත පරිදි වේ.

| දිනය | මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (කිලෝග්‍රෑම්) | දළ වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 2024.05.18 | හෙරොයින් | 279.591 | 4892 |
| | මෙතැම්ෆෙටමින් (අයිස්) | 45.654 | 228.2 |
| 2024.06.29 හා 2024.06.30 | මෙතැම්ෆෙටමින් (අයිස්) | 614.036 | 3,071.8 |
| | කෙටමින් | 581.034 | 2,906 |
| | හෙරොයින් | 13.686 | 239.4 |
| 2024.07.11 | කොකේන් | 355.881 | 7,829 |
| මුළු එකතුව | | **1889.882** | **19,166.4** |

මෙම අවස්ථාවට ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමා සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සහභාගී වූ අතර, මෙම මත්ද්‍රව්‍ය විනාශ කිරීම පූර්ණ විනිවිද බාවයකින් යුතුව ගරු අධිකරණ විනිසුරුවරුන්, අධිකරණ නිලධාරීන්, රජයේ රස පරීක්ෂක නිලධාරීන්, මාධ්‍යවේදී මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී.

වයඹ පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කිත්සිරි ජයලත් මහතා ඇතුළු රාජ්‍ය නිවේදිත නිලධාරීන් රැසක්ද මෙම අවස්ථාවට සහභාගී විය.

**මීට අදාල ඡායාරූප කිහිපයක්**


PNB


93487
41






පොලිස් මාධ්‍ය කොට්ඨාසය.